

# සිනුවර හසුන

*සිඩ්නි සිට ලියමි*

අද සිනුවර හසුනින් මුලින්ම ඔබ අතීතයට කැඳවා ගෙන යාමට මම අදහස් කරමි. ඒ ඊයේ පෙරේද අප හොඳින් දන්නා අතීතයකට නොවේ. සියවස් දෙකකටත් ඉහත කාලයකට ය. හරියටම කිවහොත් ව්‍යවහාර වර්ෂ 1788 ජනවාරි 26 දිනටය.

එද ජුබුගුලි (ගවමඉමටමකස) නමින් හැඳින්වුනා වූ ද, අද සිහල කවි බසින් " සිනුවර" නමින් හැඳින්වෙන්නා වූ ද, සිඩ්නි නම් වූ නගරයේ, එද "ඩේලි බුෂ්ග්‍රාෆ්" නමින් පුවත්පතක් පළකෙරුණා යයි මොහොතකට සිතා ගන්න. එහි ඔබට දක්නට ලැබෙන ප්‍රධාන පුවත මෙලෙස ලියවී තිබෙන්නට ඇත.

ජුබුගුලි අසල නොගැඹුරු මුහුදේ ඊයේ සැක උපදවන රුවල් යාත්‍රා කිහිපයක් දක්නට ලැබුණි.

යුරෝපාකරයේ පිහිටි එංගලන්තය නම් රටේ සිට හොරුන්, මංකොල්ලකරුවන් සහ වෙනත් සුළු අපරාධකරුවන් පිරිසක් රැගත් මේ යාත්‍රා මේ ආකාරයෙන් පැමිණෙන්නේ මෙරට නිත්‍යවාසය සඳහා යැයි සැකයක් පැන නැගී ඇත.

ඊයේ රාත්‍රියේ පවත්වන්නට යෙදුණු ඉයෝරා (ඇදරා) වැසියන් ගේ විශේෂ සභා රැස්වීමෙන් පසු වැඩිහිටි කවුන්සිලය විසින් නිකුත් කරන ලද නිවේදනයක සඳහන් වුයේ, මේ යාත්‍රා සමූහය වහා ගැඹුරු මුහුද වෙත හරවා යැවිය යුතු බවත්, එහි ගමන් ගන්නා කිසිවෙකුටවත් මෙරටට ගොඩ බැසීමට ඉඩ නොදිය යුතු බවත් ය.

අද ඕස්ට්‍රේලියාව කරා ඇදෙන සරණාගතයින් සම්බන්ධයෙන් අසන්නට ලැබෙන විවිධ ප්‍රකාශ හා එක්ව ගත් කල, ඉහත දැක්වූ ඓතිහාසික ප්‍රබන්ධ කතාවෙන් මතුවෙන උත්ප්‍රාසය ඔබට අමුතුවෙන් පැහැදිලි කර දිය යුතු යැයි මම නොසිතමි.

එද, 1788 ජනවාරියේ දී ආතර් පිලිප් කප්පිත්තාගේ නෞකා සමූහයෙන් එංගලන්තයේ සිට සිරකරුවන් පිරිසක් මෙරටට පිටුවාහල් කර එවූ දිනයේ මෙරට සිටි ආදිවාසී ඇබොරිජිනි ජනයාට එලෙස විරෝධතා දක්වන්නට හැකි කමක් නොතිබුණි. එද සිට අද දක්වාම විවිධාකාරයෙන් ඕස්ට්‍රේලියාවට ජනයා පැමිණෙති. මෙහි පදිංචි වෙති. අද ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය කරන පිරිස වසරකට එක් ලක්ෂ පනස් දහසක් පමණ වේ. හෙට ද මෙම සංක්‍රමණ ධාරාව එලෙසම පවතිනු ඇත.

වත්මන් ඕස්ට්‍රේලියාවේ ජනගහනයෙන් හතරෙන් එක් කොටසක් (25%) සංක්‍රමණිකයෝ ය. පසෙන් එක කොටසක් (20%) සංක්‍රමණික දෙමව්පියන් ගේ මෙරට උපන් දූ පුතුන් ය. රටේ විවිධ පලාත්වල වෙසෙන අමිශ්‍ර ඇබොරිජිනල් ජාතිකයින් සුළු පිරිස හැරුණු විට අන් සියළු දෙනාම සංක්‍රමණික පරම්පරාවක ට අයත් වෙති.

අපේ මව් බිම වන ශ්‍රී ලංකාවේ ඉතිහාසය ද එලෙසම වේ. අද ජීවත් වෙන ලංකාවාසීන්, මහාවංසය ට අනුව වසර දෙදහස් පන්සියයකට පෙර සිදු වූ විජයාගමනයෙන් පෙර ද, ඉන් පසු මෑත අතීතය දක්වා ද, විවිධාකාරයෙන් ලංකාද්වීපය ට සංක්‍රමණය කළ පිරිසෙන් පැවතෙන්නා වූ අය බව කීම සත්‍යයෙන් දුරස් නොවේ.

පෙර කී ආකාරයේ සංක්‍රමණික ඉතිහාසයක් ඇති ඕස්ට්‍රේලියාවේ වසන්නන් වැඩි දෙනෙකු, අද මේ ආකාරයෙන් සරණාගතයින් කෙරෙහි වෛරය මුසු සිතින් කතා කිරීම ඉතා ශෝකජනක කරුණකි.

ඒ සමගම, සමාන සංක්‍රමණික ඉතිහාසයක් ඇති ලංකාද්වීපයේ සිට ඕස්ට්‍රේලියාව සංක්‍රමණය කර ජීවත්වෙන අප සමහර දෙනෙකු ද, සරණාගතයින් ලෙසින් මෙරටට ලඟා වීමට උත්සාහ කරන්නා වූ තම සහෝදර පිරිස කෙරෙහි සැකය සහ වෛරය මුසු සිතින් කතා කිරීම ඉතා ශෝකජනක දෙයක් වෙනවා මෙන්ම එයින් අපේ ඇත්තන්ගේ කුඩුකේඩුකම (ඍහච්ඍජරසිහ) ද ඉතා හොඳින් නිරාවරණය වී පෙනේ.

කරුණු එසේ වූ නමුදු යකා කියන තරමටම කළු නැත. තමන්ගේ දේශපාලන පැවැත්ම ගැන හිතා අවස්ථාවාදී ප්‍රචාර විටින් විට නිතුත් කළ ද, මදක් කුසිතව මෙන් හැසුරුණා ද, ෆෙඩරල් රජය මේ සරණාගතයින් ට යම් සාධාරණයක් ඉටුකරනු ඇතැයි උපකල්පනය කිරීමට සාධක ඇත.

එසේම අපේ ඇත්තන් ද නිසි පරිදි අසරණ සරණ සිත් ඇත්තෝ වෙති. දැනට මාස කිහිපයකට උඩදී "උතුරට දිවියොතක්" (ඔසෑෙකසබඃ එද හඳරඑය) නමින් අරමුදලක් රැස්කර එය උතුරු ලංකාවේ සරණාගත කඳවුරුවල ක්‍රියාත්මක වෙන ස්වේච්ඡා සංවිධානයකට යොමු කළෝ ද සිනුවර වැසියෝ ම ය.

අවසාන වශයෙන් මෙය ද කිව යුතුය. අද කළාක් මෙන් දේශපාලන මාතෘකා ගැන ලිවීමට සිනුවර හසුන ආරම්භයේ දී මම නොසිතුවෙමි. පසුගිය මාසය දක්වාම මා ලියුවේ සිඩ්නි නුවර කලා, සංස්කෘතික සහ සෞන්දර්යාත්මක තොරතුරු පමණි. මෙවර වාරිකය ඒකෝච්චියක් ම (ධබෑ-දංෙ) වේවා!

ලබන මාසයේ නැවත හමුවෙමු.

සිනුවර ආරච්චිල

<sinuwara.arachchila@gmail.com>

MIGRATE TO AUSTRALIA

MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES

The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students
"EXPERIENCE THE DIFFERENCE"
Affordable fees & easy payment terms

Meet our qualified consultants with years of experience who can deliver the results
Senior Migration Consultants:
Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.
Consultation by Appointment only
Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA
MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696